4 ව්‍යවසායකත්ව පෞරුෂය

නිපුණතා අංක 4	:	ව්‍යවසායකත්ව ගතිලක්ෂණ/ගුණාංග සංවර්ධනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනියි.
නිපුණතා මට්ටම 4.1	:	පුද්ගලික ව්‍යවසායකත්ව පෞරුෂය තක්සේරු කරයි.

ව්‍යවසායකත්ව පෞරුෂය. . .

ව්‍යවසායකයකු බවට පත්වීමේ හැකියාව ඔබට ද ඇත. ඔබ සිතාවි ඒ සඳහා මුදල් අවශ්‍ය බව, එහෙත් ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ බොහෝ රටවල ඉතා සුළු මුදලකින් ඇරඹූ ව්‍යාපාරය විශාල ව්‍යාපාර බවට පත් කර ගත් බොහෝ අය සිටිති. එසේ නම් ඔවුන්ට එම තත්වයට ළඟාවීමට උපකාර වූයේ මුදල් පමණක් නොවේ. ඔවුන්ගේ සමහර පෞරුෂ ගුණාංග ඒ සඳහා බෙහෙවින් ම බලපා ඇත.

ව්‍යවසායක භූමිකාවට පිවිසෙන්නා තුළ වර්ධනය කරගත යුතු ගුණාංග කිහිපයක් පහත දැක්වේ.

- දැක්ම හා අනාගත අවධානය
- ආත්ම විශ්වාසය
- ප්‍රතිඵල දිශානතිය
- තීරණ ගැනීම හා ගැටළු විසඳීම
- පුද්ගලාන්තර කුසලතා
- කණ්ඩායම් හැඟීම

මේ පිළිබඳව විස්තරාත්මකව ඉදිරි පිටුවල විස්තර කෙරේ. අවබෝධයකින් යුක්ත ව කටයුතු කිරීම මෙහිදී අවශ්‍ය වේ. මෙසේ නවෝත්පාදනයට යොමුවූ ව්‍යවසායකයෝ සංවර්ධිත රටවල විශාල වශයෙන් සිටිති. එහෙත් ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට ව්‍යවසායක චින්තනය බෙහෙවින් වැදගත් වනු ඇත.

ක්‍රියාකාරකම

ව්‍යවසායකයකුට තිබිය යුතු පෞරුෂ ගුණාංග විග්‍රහ කරන්න.

නිපුණතා අංක 4	: ව්‍යවසායකත්ව පෞරුෂය සංවර්ධනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනියි.
නිපුණතා මට්ටම 4.2	: නිර්මාණාත්මක හා නව්‍යාත්මක හැසිරීම් ප්‍රදර්ශනය කරයි.

පරිකල්පනික චින්තනය. . .

ඇතැම් අයට සම්පත් තිබුණ ද ඒවා ඵලදායී මාර්ග වල ආයෝජනය කිරීමට මැලිවෙති. මිත්‍යා මතවාද ඔස්සේ සිතති. එනම් තමා ජීවත් වන සමාජයීය, ආර්ථික හා සංස්කෘතික පරිසරය ඔස්සේ තවදුරටත් ගතානුගතික ලෙස කටයුතු කරති. නිදසුන් ලෙස ගතහොත්.,

- ණයවීමට අකමැති ය.
- සත්ව පාලන කටයුතුවලට අකමැති ය.
- කෙනකු දැනට සාර්ථකව කරන ව්‍යාපාර කටයුතුම තෝරාගනියි. ගම්බද මෙන් ම නගරබදව ද මෙම තත්වය වෙනසක් නොවේ. නමුත් හොඳ ව්‍යවසායකයෙකු තමා ජීවත් වන පරිසරය මැනවින් අධ්‍යයනයට ලක් කරනු ඇත.

එමඟින්,

- පරිසරයෙන් අවශ්‍යතා හා වුවමනාවන් හඳුනා ගැනීම.
- පරිසරයට ගැලපෙන අයුරින් තම අදහස් හැඩගස්වා ගැනීම.
- සම්ප්‍රදායික ආකල්ප වලින් මිදී නව්‍යතාවයෙන් යුතුව සිතීම., සඳහා යොමු වනු ඇත.

බුද්ධි කලම්භනය

කිසියම් කාර්යයක් සඳහා නිශ්චිත අදහසක් හෝ විසඳුමක් ලබා ගැනීම සඳහා සියලු පාර්ශවයන්ගේ අදහස් ලබා ගෙන එමගින් වඩාත් ම සාර්ථක විසඳුමක් ළඟාකර ගැනීම වේ.

නිර්මාණාත්මක බව

අපට නව ලොවක් නිර්මාණය වූයේ නිර්මාණාත්මකව සිතීමට යොමුවූ අයගේ කැපවීම නිසා ය. ලංකාව මෙන් ම ලොව සෑම රටක ම පාහේ නිර්මාණාත්මක චින්තනයට යොමු වූ අය නිසා ක්‍රමයෙන් සුව පහසු දිවි පෙවෙතක් ගතකිරීමට සමාජයේ වෙසෙන බොහෝ දෙනකුට හැකියාව ලැබී තිබේ. මෙසේ නිර්මාණාත්මක බව කුඩා පරිමාන නිමැවුම්වල මෙන් ම මහා පරිමාන නිමැවුම්වල ද සිදුවී තිබේ. එය අද මෙන් ම හෙට ද සිදු විය යුතු ය. ඒ සඳහා චින්තනය යොමු වීම අවැසිය.

නවෝත්පාදනය

අප විසින් ම යමක් නිර්මාණය කිරීම, පවත්නා දෙයට නව අංග එකතු කිරීම, පවත්නා නිෂ්පාදනයක් නව ආකාරයකට ඉදිරිපත් කිරීම නවෝත්පාදනය හෙවත් නව්‍යතා බිහිකිරීම වේ.

ව්‍යවසායක චින්තනය නවෝත්පාදනය සඳහා යොමුවීම තුළින්. . .

- ප්‍රයෝජනයට නොගත් සම්පත් ප්‍රයෝජනයට ගැනෙනු ඇත.
- ප්‍රයෝජනයට ගත් සම්පත් විකල්ප මාර්ග කරා යොමුකෙරෙනු ඇත.
- සමාජයට පෙර නොවූ විරූ භාණ්ඩ හා සේවා පරිහරණයට අවස්ථාව ලැබෙනු ඇත.

එය සමාජයට නවමු අත්දැකීමක් වනු ඇත. සාම්ප්‍රදායික නොවන ක්‍රම, විධි හා තාක්ෂණය භාවිත කරමින් සිදුකරන නිෂ්පාදන ක්‍රියා නිසා ආර්ථික වාසි අත්පත් වනු ඇත. මෙසේ නවෝත්පාදනය ආර්ථික සංවර්ධනයේ පදනම වනු ඇත.

ක්‍රියාකාරකම

ඔබ ප්‍රදේශයේ ප්‍රයෝජනයට නොගත් සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ආරම්භ කළ හැකි ව්‍යාපාර ලැයිස්තු ගත කර එය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

නිපුණතා අංක 4	: ව්‍යවසායකත්ව පෞරුෂය සංවර්ධනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනියි.
නිපුණතා මට්ටම 4.3	: දැක්ම හා පරමාර්ථ ජනනය කරයි.

අනාගත පෙර දැ ක්ම....

දැක්ම/දෘෂ්ඨිය

සෑම ව්‍යවසායකයකුට ම සිය නිර්මාණශීලීත්වය අනුව යමක් කෙසේ සිදුවිය යුතු ද යන්න පිළිබඳව පෙර දැක්මක් තිබීම අවශ්‍ය වේ.

ව්‍යවසායකයා ආයතනයේ ප්‍රධානියා ද වන හෙයින් ආයතනය යම් අනාගත දවසක කවර තත්ත්වයකට පත්වන්නේ ද යන්න පිළිබඳ දිගුකාලීන දැක්ම මෙහිදී තිබීම වැදගත් වේ.

මේ අනුව ව්‍යවසායකයා යමක් ලබාගැනීම හෝ ඉටුකර ගැනීම සඳහා,

- ඒ පිළිබඳව නිරවුල්ව කල්තබා සිතීම
- අනාගතයේ පැවතිය යුතු තත්ත්වය මනසින් දැකීම අවශ්‍ය වේ.

ව්‍යවසායකයා සෑම විට ම නිර්මාණශීලී අයකු වන්නේ තම අපේක්ෂාවන් කල් ඇතිව දැකීම ඒ පිළිබඳව දිගින් දිගට ම සිතීම හා ඒ පිළිබඳ තීරණ ගැනීම යන කරුණු සඳහා දක්වන කුසලතා මත ය.

ව්‍යවසායකයා තුළ පවතින දැක්ම සමස්ත කාර්යභාරය සම්පිණ්ඩනය කර දැක්වීමක් නිසා,

1. දැක්ම ස්වාධීනව ගොඩ නැගුණු එකක් වීම
2. යම් කෙනෙකුගේ මඟ පෙන්වීමක් අනුව සිදු විය හැකි වීම වැදගත් වේ.

දැක්ම තිබීම පමණක් ව්‍යවසායකයකුට ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා...,

- කැපවීම
- ධෛර්යය
- අධිෂ්ඨානය තිබිය යුතු ය.

මෙම ගුණාංග වැඩි දියුණු කර ගනිමින් කටයුතු කිරිම අවැසි වේ. ව්‍යාපාර පමණක් නොව සෑම කෙනෙකුට ම කිසියම් ජීවන දැක්මකින් යුක්ත ව කටයුතු කිරිමෙන් ජීවිතය මැනවින් හැඩගස්වා ගැනීමට හැකි වනු ඇත.

විවිධ ආගම් මගින් මෙසේ මිනිසුන්ට කිසියම් ජීවන දැක්මක් පිළිබඳව මග පෙන්වීමක් සිදුකරන බව පෙනේ.

උදාහරණ : බුද්ධාගම - නිර්වාන අවබෝධයට පත් වීම.
ක්‍රිස්තියානි ආගම - ස්වර්ගය වෙත යාම.
ඉස්ලාම් ආගම - අල්ලා දෙවියන් වෙත යාම.
හින්දු ආගම - බ්‍රහ්මත්වය සමග එක්වීම.

ඉලක්ක පිහිටුවීම. GOALS

දැක්ම පිලිබඳව තවදුරටත් පැහැදිලි කිරීමක් ඉලක්ක මගින් සිදු වේ. එනම් සිය කටයුත්තේ විවිධ අංශ හඳුනා ගෙන ඒ එක් එක් අංශය සඳහා ඉලක්ක පිහිටුවා ගත යුතු ය. අපට යාමට යම් දුරක් ඇතොත් ඒ දුර ගමන් කිරීම සඳහා, යා යුතු තැනට ළඟාවීම සඳහා පසු කළ යුතු ස්ථාන පිළිබඳව කල් ඇතිව සිතා බැලිය යුතු ය. ඉලක්ක පිහිටුවා ගත යුත්තේ ප්‍රමුඛතාවය අනුව පෙලගැස්වීමකට අනුව ය. ව්‍යවසායකයකු වශයෙන් මාස 3 ක දී, මාස 6 ක දී, වසරක දී යනාදී වශයෙන් දැක්ම මුදුන්පත් කර ගැනීමෙහිලා යොමු විය යුතු ය. අප විසින් සිදුකරනු ලබන ඕනෑම කටයුත්තක් ඉලක්කයක් මත නොකළහොත් එය ඵලදායක නොවනු ඇත.

පරමාර්ථ පිහිටුවීම. - OBJECTIVES

ව්‍යවසායකයකුට පරමාර්ථ හඳුනා ගත හැක්කේ ඇතිකර ගත් දැක්ම හා පිහිටුවාගත් ඉලක්ක අනුව යි. මන්ද ඉලක්ක සපුරා ගැනීමක් පරමාර්ථ මගින් සිදු විය යුතු හෙයින් ආයතනයක් කෙටි කාලීනව අපේක්ෂා කරන ප්‍රතිඵල පරමාර්ථ මගින් හඳුනා ගත හැකි ය.

මේ අනුව පරමාර්ථ ගොඩ නගා ගැනීමේදී ඒවා කාලය හා සම්බන්ධ ප්‍රමාණාත්මක නිර්ණායක ලෙස හඳුනාගැනීම් වැදගත් ය. මෙහිදී සැලකිලිමත් වියයුතු කරුණු කීපයකි.

- සුවිශේෂී විය යුතු ය. **SPECIFIC**
- මැනිය හැකි ඒවා විය යුතු ය. **MEASURABLE**
- ළඟාකරගත හැකි ඒවා විය යුතු ය. **ACHIEVABLE**
- තාත්වික ඒවා විය යුතු ය. **REALISTIC**
- කාලානුරූප විය යුතු ය. **TIME BOUND**

ආයතනයක් ළඟාකර ගත නොහැකි වූත් තාත්වික නොවූත් මැනිය නොහැකිවූත් පරමාර්ථ ගොඩනගා ගැනීම පලක් නොවේ.

සෑම ව්‍යවසායකයා ම තමන් ගොඩ නගා ගන්නා පරමාර්ථ මගින් ඉලක්ක සපුරා ගැනීමත් ක්‍රම ක්‍රමයෙන් දැක්ම කරා ළඟා වීමටත් හැකියාව ලබා ගනී. ව්‍යවසායකයා විසින් ඇති කර ගත් පරමාර්ථ **SMART** වන්නේ නම් පිහිටුවා ගත් ඉලක්ක කරා දැක්ම කරා ළඟාවීමට හැකියාව ලැබෙනු ඇත.

ක්‍රියාකාරකම

1. ව්‍යවසායකයකු වශයෙන් ඔබ තෝරා ගන්නා ව්‍යාපාරය නම් කරන්න.
2. එම ව්‍යාපාරයට ගැලපෙන දැක්ම, ඉලක්ක හා පරමාර්ථ සටහන් කරන්න.

නිපුණතා අංක 4	: ව්‍යවසායකත්ව පෞරුෂය සංවර්ධනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනියි.
නිපුණතා මට්ටම 4.4	: ආත්ම විශ්වාසය ගොඩ නගයි.

ආත්ම විශ්වාසය ගොඩනැගීම. . .

ව්‍යාපාර කටයුතු අපේක්ෂිත අයුරින් ම සාර්ථක වේ යැයි සෑම විට ම බලාපොරොත්තු විය නොහැක. පරාජය, බිඳවැටීම්, අසහනය යනාදිය මධ්‍යයේ වුව ද නොසැලී දැඩි අධිෂ්ඨානයෙන් යුක්තව අරමුණු සපුරා ගැනීම සඳහා කටයුතු කිරීම අවශ්‍ය වේ. සාර්ථක වූ සෑම ව්‍යවසායකයකුගේ ම අතීතයේ දුක් කම්කටොළු නැත්තේ නොවේ. ඒවා අපතේ ගිය දෙයක් ලෙස නොව අත්දැකීම් බවට පත්කර ගැනීම මින් අදහස් කෙරේ. මෙහිදී ආත්ම විශ්වාසයෙන් කටයුතු කළ යුතු ය.

- නිදහස් චින්තනය ඇතිකර ගැනීම.
- අභියෝග වලට මුහුණදීම.
- අවදානම දැරීම පිළිබඳව සැළකිලිමත් විය යුතු ය.

නිදහස් චින්තනය හෙවත් ස්වාධීන බව අවශ්‍ය වේ. එනම් තම අභිමතය පරිදි තීරණ ගැනීමට හා ඒ අනුව ක්‍රියා කිරීමට ව්‍යවසායකයා අපේක්ෂා කරයි. තමා ගත් තීරණය අනුව යම් වරදක් වුවත් ඒ ගැන වෙනත් පාර්ශවයකට පිලිතුරු සැපයීමට අවශ්‍ය නැත.

- අනෙකුත් අයගේ අදහස් මත යැපෙන්නේ නැත.
- අනෙකුත් අයගේ අදහස් ගරු කරන නමුත් ඒ මත තීරණ නොගනී.
- තමන් යා යුතු ගමන් මග තමන් ම තීරණය කරයි.
- පාලනය විය යුතු ආකාරය තමන් ම නිශ්චය කර ගනී.

අභියෝග වලට මුහුණදීම. . .

ව්‍යවසායකයා තම අරමුණු ඉටු කර ගැනීමට යාමේ දී පරිසරයෙන් සිදු වන බාධා අභියෝග ලෙස සැලකේ. එම අභියෝග මූල්‍යමය, සමාජමය, ශාරීරිකමය හෝ මානසික ඒවා විය හැකි ය.

වෙළෙඳපොළ තරගකාරීත්වයෙන් යුක්ත ය. එමනිසා,

- එම තරගයට මුහුණදීම.
- විවිධ සම්පත් භාවිතයට ගැනීම.
- සම්පත් සම්පාදනය සම්බන්ධ ගැටළු වලට මුහුණ දීම

යනාදී වශයෙන් අභියෝගවලට මුහුණ දීමට සිදු වේ. එහෙත් මෙහි දී...,

- ඉවසීම
- උසස් අභිලාෂ මට්ටමකින් යුතු වීම
- කාරුණික වීම

- යම් යම් දේ පිළිබඳව පසු විපරම් කිරීම

යනාදී ගුණාංග වලට අනුව බාධක හා අසීරුතා හමුවේ නොසැලී සිටීමට හැකියාව ලැබෙනු ඇත.

අවදානම දැරීම. . .

මුල් යුගයේ දී ව්‍යවසායකත්වයේ මූලික තේමාව වූයේ ද අවදානම දැරීම ය. නමුත් අද එය තවත් එක් මූලිකාංගයක් ලෙස හඳුනා ගනී. ව්‍යවසායකයා නොපෙනෙන ඉලක්කයන් කරා ළඟාවීමට අරමුණු මෙහෙයව යි. එය සාර්ථක විය හැකි නොහැකි බව තුළ අවදානමක් ඇත. එම අවදානමට මුහුණදීමට කැමති අය මෙන් ම අකමැති අයද සිටිති. එසේනම් ව්‍යවසායකයා...,

- අවදානම හඳුනාගත යුතු ය.
- මැන තක්සේරු කර ගත යුතු ය.
- සාර්ථක වීමේ ප්‍රවනතාවය අසාර්ථක වීමේ ප්‍රවනතාවයට වඩා වැඩිනම් අවදානම භාර ගත යුතු ය.
- ඉන්පසු අවදානම හැකිතාක් දුරට අවම කරගැනීමට ක්‍රියා කළ යුතු ය.

ක්‍රියාකාරකම

ආත්ම විශ්වාසය මත අභියෝගවලට මුහුණ දෙමින් ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගත් ව්‍යවසායකයෝ රටට සම්පතකි. එවැනි ව්‍යවසායකයන්ගේ චරිතාංග පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

නිපුණතා අංක 4	: ව්‍යවසායකත්ව පෞරුෂය සංවර්ධනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනියි.
නිපුණතා මට්ටම 4.5	: ගැටළු විසඳීමේ දී නිවැරදි තීරණ ගනියි.

ගැටළු විසඳීමේ ක්‍රියාවලිය. . .

ව්‍යාපාරික ලෝකය අභියෝගවලින් මෙන් ම ගැටළු වලින් ද ගහණ වූවකි. සෑම ව්‍යවසායකයකු තුළ ම මේවා පැහැදිලි ලෙස,

- හඳුනා ගැනීම හා විශ්ලේෂණය
- විකල්ප තේරීම හා ඇගයීම
- තාර්කික චින්තනය හා විනිශ්චය
- ප්‍රතිපෝෂණය

පිළිබඳව හැඟීමකින් යුක්ත ව කටයුතු කිරීම වැදගත් වේ. එයට හේතු ලෙස දැක්විය හැක්කේ,

- බොහෝ ව්‍යාපාරික ගැටළු විශේෂයෙන් ම ව්‍යාපාරය තුළින් ම හට ගැනීම

  උදාහරණ :
  - *අවශ්‍ය මුදල් හිඟකම,*
  - *යන්ත්‍ර හිඟකම,*
  - *පුහුණු සේවකයන් හිඟකම*

- සමහර ව්‍යාපාරික ගැටළු ව්‍යාපාරයට පරිබාහිරව ඇති වීම

  උදාහරණ : ඛණිජ තෙල් මිල ඉහළ යාම

- සමහර ගැටළු පරිබාහිරව ඇතිවී ව්‍යාපාරය තුළ ද ගැටලුවක් ලෙසින් මතු විය හැකි වීම නිසා ය.

  උදාහරණ : සේවක වර්ජන

මෙවැනි ගැටළුවලට නිශ්චිත එක ම විසඳුමක් නොමැති නිසා විකල්ප විසඳුම් තුළින් හොඳ ම විසඳුම තෝරා ගත යුතු ය. එමෙන් ම විසඳුමකට එළඹීමේ දී එය ක්ෂණිකව නොකළ යුතු අතර වඩා සාර්ථක වන්නේ එය පියවරෙන් පියවර සිදු කළ විට ය.

තීරණ ගැනීම

විශේෂයෙන් ම ව්‍යවසායකත්වයට අදාළව තීරණ ගැනීමේ දී පුද්ගලයින් නිර්මාණශීලී විය යුතු ය. ව්‍යවසායකයන් ඔවුන් පිළිබඳ ව මෙන් ම ඔවුන් සතු සාර්ථක තීරණ ගනීමේ හැකියාව පිළිබඳව දැඩිව විශ්වාස කළ යුතු ය. මෙම තීරණ ගැනීමේ හැකියාව ව්‍යවසායකයන් වෙන් කර හඳුනා ගන්නා ලක්ෂණය වේ. ව්‍යවසායකයන් විසින් ඔවුන්ගේ ව්‍යාපාරවල අනාගතයට විශාල බලපෑමක් ඇති කරන සියලු වැදගත් තීරණ ගනු ලැබේ. ඉතා වැදගත් ව්‍යවසායකත්ව සම්පතක් වන ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව ලැබෙන්නේ සංකීර්ණ තත්වයන් යටතේ තීරණ ගැනීමෙන් ලබන පලපුරුද්ද තුළිනි.

ව්‍යවසායකයන් ඔවුන්ගේ තීරණ ගැනීමට එළඹෙන විට දී සාම්ප්‍රදායික කළමනාකරුවන්ට වඩා නිර්මාණශීලී විය යුතු ය. ඔවුන් විවිධ කෝණයන් තුළින් ගැටළු දෙස බැලිය යුතු වන අතර ඒවා විසඳීම සඳහා නව මාර්ග සෙවිය යුතු වේ. දෙන ලද විශේෂ තත්වයන් තුළ ලැබිය හැකි ප්‍රතිඵල සහ අත් වූ විපාක පිළිබඳව කල් තියා දැන ගැනීමට ඔවුන්ට හැකි විය යුතු ය.

බොහෝ ව්‍යවසායකත්ව තීරණ විෂයානුබද්ධ වන බැවින් ඒවා හැඟුම්බර බැඳීම්වලින් සම්පූර්ණයෙන් ම නිදහස් විය නොහැක. තීරණයක් හැඟුම්බර ආකාරයට ම නිමාවනු දැකීම සඳහා ව්‍යවසායකයකු විසින් විභව විසඳුම්වල වාසි අවාසි හඳුනා ගත යුතු ය. මෙම ව්‍යවසායකයන්ට නිශ්චිත තීරණයක ප්‍රතිඵල වැඩි බලාපොරොත්තු සහිතව දැකීමට උපකාරී වනු ඇත.

ගැටලු විසඳීමේ දී සහ තීරණ ගැනීමේ දී අනුගමනය කළ යුතු නිශ්චිත ක්‍රම තිබෙන බව තීරණ ගැනීමේ ''විද්‍යානුකූල ක්‍රමය'' මගින් පෙන්නුම් කරයි. මෙම ක්‍රියාවලියට පහත සඳහන් පියවර සාමාන්‍යයෙන් අඩංගු වේ.

1) ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම
2) ගැටළුවට ප්‍රධාන හේතු නිශ්චය කිරීම
3) ගැටළු විසඳීම හා විභව විසඳුම් (විය හැකි විසඳුම්) තීරණය කිරීම
4) විභව විසඳුම් ඇගයීම
5) හොඳම විසඳුම තෝරා ගැනීම
6) විසඳුම ක්‍රියාත්මක කිරීම
7) එම විසඳුම නිවැරදි දැයි සොයා බැලීම

මෙම බුද්ධිමත් ප්‍රවේශය තර්කානුකූල සහ යෝග්‍ය වුවත් මෙම ''විද්‍යාත්මක ක්‍රමය'' අවශ්‍යයෙන් ම ගැටළුවක් සඳහා විසඳුමක් නොසපයනු ඇත. විසඳුමක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ව්‍යවසායකයකුගේ නායකත්වය සහ ශක්තිය ද අවශ්‍ය වේ. තීරණය ක්‍රියාත්මක කිරීමේ දී යම් ප්‍රමාණයක දැඩි බවක් සහ උද්යෝගයක් ද අවශ්‍ය වේ. විසඳුමක අනාගත ප්‍රතිඵලය පිළිබඳව ව්‍යවසායකයකු ධනාත්මක විය යුතු ය. ඔවුන් තීරණයක දෙවන අනුමානයක් පිළිබඳව කාලය වැය නොකරනු ඇත. ඔවුන් තීරණයක් ක්‍රියාත්මක කරන විට දී සියලුම ගැටළු සහ අවිනිශ්චිතතාවන් පසෙක තබනු ඇත. ඔවුන්ගේ ක්‍රියාවන්හි දී ව්‍යවසායකයන් ස්ථිර විය යුතු ය. ආයතනයන්ට ඒකාන්ත පරමාර්ථයන් සහ ඉෂ්ඨ කර ගැනීමට අවශ්‍ය පැහැදිලිව හඳුනා ගත් ඉලක්කයන් තිබිය යුතු ය. බොහෝ ව්‍යවසායකයන් අසාර්ථක වීමට බියක් දක්වන හෙයින් තීරණ ගැනීමේ දී ඔවුහු සුළු බියක් දක්වති. සාර්ථක වීම සඳහා ඔවුහු ඔවුන්ගේම තත්වයන් පිහිටුවා ගනිති.

විශේෂයෙන් ම ව්‍යාපාරයක් වර්ධනය වන අවස්ථාවේ දී තීරණයක් ගන්නා විට කාලය නිශ්චය කර ගැනීම ඉතාම වැදගත් වේ. ඇතැම් අවස්ථාවල තීරණය ඉතා ඉක්මනින් ගත යුතු වන අතර ඒවා ක්ෂණිකව ක්‍රියාත්මක ද කළ යුතු වේ. යහපත හෝ අනාගත තත්වයන් වර්ධනයන් හෝ පරිසර වෙනස් වීම් පිළිබඳව කිසිම දැනීමකින් තොරව සමහර ව්‍යවසායකත්ව තීරණ ගනු ලැබේ. තීරණ ක්‍රියාත්මක කිරීම ඵලදායී ලෙස

පරීක්ෂා කිරීමෙන් මෙම තීරණයන්හි පවතින යම් යම් දුර්වලතාවන් පෙන්නුම් කරනු ලබන අතර ව්‍යවසායකයකු විසින් කළ යුතු පසු විපරම් පිළිබඳව තොරතුරු ද සපයනු ලබයි.

තීරණාත්මක තීරණ ගැනීම පහසු නොවේ. එහෙත් මෙම තීරණ නිරන්තරව ගැනීම අවශ්‍ය විය හැකි ය. ව්‍යවසායකයන් විසින් කිසියම් හෝ තීරණයක් ගැනීමෙන් සම්පූර්ණයෙන් ම වැළකී සිටීම වැරදි තීරණයක් ගන්නවාට වඩා අහිතකර ය. තීරණ ගැනීම යම් කලාවක් බව මතක තබා ගන්න. මෙය වැඩි වශයෙන් පුරුදු කිරීමෙන් ව්‍යවසායකයා වඩා ප්‍රවීණයෙකු බවට පත් වේ.

ගැටළුව තේරුම් ගැනීමෙන් පසුව සහ අදාළ සියලු තොරතුරු සහ දත්තයන් ලබා ගැනීමෙන් පසුව එම ගැටළුවට සුදුසු විය හැකි විසඳුම ව්‍යවසායකයා විසින් හඳුනා ගත යුතු වේ. ඇතැම් විට සේවකයන් කණ්ඩායමක් විසින් බුද්ධි කලම්බනය කොට විකල්ප විසඳුම් ලැයිස්තුවක් සකස් කිරීමට පුළුවන. කෙසේ වුව ද ඉතාමත් සංකීර්ණ ප්‍රශ්න සඳහා ''නිවැරදි'' විසඳුමක් නොමැති අතර විය හැකි වඩා හොඳ ම විසඳුම සොයා ගැනීම ව්‍යවසායකයාට අයත් කාර්යයකි.

ක්‍රියාකාරකම

''ව්‍යාපාරිකයන් මුහුණ දෙන ගැටළු විවිධාකාර වේ. ගැටළු සඳහා ද විකල්ප විසඳුම් ඇත.''

ඉහත ප්‍රකාශය සනාථ කිරීම සඳහා ඔබගේ අදහස් දක්වන්න.

නිපුණතා අංක 4	: ව්‍යවසායකත්ව පෞරුෂය සංවර්ධනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනියි.
නිපුණතා මට්ටම 4.6	: ප්‍රතිඵල කෙරෙහි දිශානුගත වීම ප්‍රදර්ශනය කරයි.

ප්‍රතිඵල කෙරෙහි දිශානුගත වීම. . .

පිහිටුවා ගත් අරමුණු ඉලක්ක කරා යොමු කිරීමේ දී සිය සමස්ත කාර්ය භාරය ම එහි ප්‍රතිඵල කෙරෙහි යොමු කිරීමට සැළකිලිමත් වීම අවශ්‍ය වේ. මෙහිදී..,

- වැඩට කැපවීම
- වැඩට කැපකිරීම
- නොපසුබස්නා උත්සාහය
- ක්‍රියා මූළික වීම - කෙරෙහි සැළකිලිමත් වීම.

ව්‍යවසායකයෙකු තුළ ගිව්සගත් වැඩට ඇති කැපවීම අවශ්‍යයෙන්ම තිබිය යුතු ය. කාලය ජය ගැනීමට, අරමුණට ළංවීමට තම කැප වීම සහ කැප කිරීම ප්‍රදර්ශනය කළ යුතු අතර එය අන් අයගේ ද ආකල්ප වෙනස් කිරීමට බලපානු ඇත.

උදාහරණ : ආයතනයක ප්‍රධානියා දවසේ වැඩි කාලයක් කුඩු මහත් කාර්යයන් සඳහා නියැලෙන ආකාරය දකින්නෝ එය ටිකෙන් ටික අනුගමනය කිරීමට යොමු වූ බව බොහෝ ව්‍යාපාරික තොරතුරු මගින් අනාවරණය කර තිබේ.

ව්‍යාපාරික කටයුතුවල දී පැන නගින ගැටළු හමුවේ නොසැලී පරමාර්ථ ඉටුකර ගැනීමට යොමු විය යුතු ය. මෙහි දී,

- බාධාවන් ජයගැනීම සඳහා නැවත නැවත විවිධ ක්‍රියාමාර්ග භාවිතා කිරීම.
- මුල් අවස්ථාවේ සාර්ථක ප්‍රතිඵල නැතත් තම විනිශ්චයෙහි පිහිටා කටයුතු කිරීම.
- විරුද්ධතාවයන් හමුවේ ඉන්ද්‍රඛීලයක් සේ නැගී සිටීම.

තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාර්ථකව ළඟාකර ගැනීමට යොමු විය යුතු ය.

කතාව දෝලාවෙන් ගමන පයින් යනුවෙන් ජනවහරක් තිබේ. එනම් බොහෝ දෙනාගේ අරමුණු ජයගැන්ම කටින් මිස ක්‍රියාවෙන් නොවන අවස්ථා ජන සමාජයේ බහුලව දැකිය හැක්කකි. එම නිසා අවශ්‍ය වනුයේ ක්‍රියාමූලික වීම ය. ඒ සඳහා තමන් මෙන් ම තම කාර්ය මණ්ඩලය යොමුකර ගැනීම වැදගත් වනු ඇත.

ක්‍රියාකාරකම

ඔබගේ ප්‍රදේශයේ තිබෙන සම්පත් අනුව යොමු විය හැකි ව්‍යාපාර කටයුත්තක් තෝරා ගන්න. එම ව්‍යාපාරය ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී මතු විය හැකි ගැටළු ලැයිස්තු ගත කරන්න.

නිපුණතා අංක 4	: ව්‍යවසායකත්ව පෞරුෂය සංවර්ධනය කර ගැනීමට ක්‍රියා මාර්ග ගනියි.
නිපුණතා මට්ටම 4.7	: අන්තර් පුද්ගල කුසලතා ගොඩ නගයි.

අන්තර් පුද්ගල කුසලතා. . .

ව්‍යවසායකයාට කටයුතු කිරීමට පරිසරයක් තිබේ. මෙහි දී අභ්‍යන්තර පරිසරය මෙන්ම බාහිර පරිසරය ද වශයෙන් සැලකූ විට ඒවායේ විවිධ අංශ, පුද්ගලයන් ව්‍යාපාරය හා ඇල්මෙන් කටයුතු කරන බව පෙනේ. එමෙන් ම ව්‍යාපාරය ද මෙම පාර්ශවයන් සමග අන්තර් සම්බන්ධතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.



මේ අයුරින් ගණුදෙනුකරුවන්, ගණකාධිකාරීන්, නීතීඥයන්, සැපයුම්කරුවන්, බැංකු හා මූල්‍ය ආයතන සමග ඇතිකරගන්නා සම්බන්ධතා ව්‍යාපාර කටයුතු වල වර්ධනයට ඉවහල් වනු ඇත.

මෙහිදී,

- පෙළඹවීම/ඒත්තුගැන්වීම
- ජාල සම්බන්ධතා
- සන්නිවේදනය

යනාදී ක්‍රියාකාරකම් ඔස්සේ මෙම සම්බන්ධතා ඇති කරගැනීමට, පවත්වා ගෙන යාම සිදු කිරීමට පුළුවන.

1. පෙලඹවීම/ ඒත්තු ගැන්වීම යනු තමන්ට අයත් කාර්යයක් සිය කැමැත්තෙන් හා උද්‍යෝගයෙන් ඉටු කිරීමට ආයතනය හා සම්බන්ධ පාර්ශවයන් පෙළඹවීම යි.

   ව්‍යාපාර සාර්ථකත්වය සඳහා ඒ වෙනුවෙන් දිගු කාලයක් කැපවීමෙන් ක්‍රියා කිරීමට පෙළඹීම අත්‍යවශ්‍ය කරුණකි. තමන් පමණක් නොව තම අවට පරිසර ප්‍රජාව ද කෙරෙහි මෙම පෙළඹවීම පතුරුවා හැරීම ව්‍යවසායකයෙකු ගේ වගකීම යි.

2. විවිධ පාර්ශවයන් අතර ජාලමය සම්බන්ධතා මැනවින් පවත්වා ගත යුතුවේ. එය එක් එක් මට්ටම් ඔස්සේ සිදු විය හැකි ය. ජාල සම්බන්ධතා දෙපාර්ශවයට ගලා යා යුතු ය.



3. සන්නිවේදනය

යම් කාරණයක් ඉක්මනින්, නිවැරදිව සිදු කිරීමට නම් මනා ලෙස සංවිධානය වූ සන්නිවේදන පද්ධතියක් තිබීම අවශ්‍යතාවයක් ව පවතී. ව්‍යාපාරය තුළ මෙන් ම ව්‍යාපාරයෙන් බාහිර එනම් දේශීය වශයෙන් මෙන් ම අන්තර්ජාතික වශයෙන් ද මෙම සබඳතාවයට ඉඩකඩ සැලසෙන සේ ව්‍යුහය සකස් විය යුතු ය.



ආයතනයක් විසින් අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය සඳහා භාවිත කරන ක්‍රම පහත දැක්වෙන අයුරින් වර්ග කළ හැකි ය.

- වාචික
- ලිඛිත
- සංඥා හා සලකුණු

මෙම ක්‍රම,

- විද්‍යුත් ක්‍රම
- විද්‍යුත් නොවන ක්‍රම

  වශයෙන් ද වර්ග කළ හැකි ය.

නිදසුන් :



සන්නිවේදනය ක්‍රියාවලියකි. එම ක්‍රියාවලියේ වැදගත් කොටස් පහත සන්නිවේදනයේ මූලිකාංග ලෙස හඳුන්වමු.



එසේ ම කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමයක තිබිය යුතු ගුණාංග කිහිපයක් පහත සඳහන් පරිදි ය.

- නිවැරදි බව
- අඩු පිරිවැය
- වේගය
- රහස්‍යභාවය

ක්‍රියාකාරකම

1. ව්‍යාපාරිකයකු අභ්‍යන්තර වශයෙන් සම්බන්ධකම් පැවැත්විය යුතු පාර්ශවයන් මොනවා ද? එවැනි සම්බන්ධතා මගින් ලබාගත හැකි ප්‍රයෝජන දක්වන්න.
2. ව්‍යාපාරිකයකුට බාහිර වශයෙන් සම්බන්ධතා පැවැත්වීමට සිදුවන පාර්ශවයන් දක්වන්න.

නිපුණතා අංක 4	: ව්‍යවසායකත්ව පෞරුෂය සංවර්ධනය කර ගැනීමට ක්‍රියාමාර්ග ගනියි.
නිපුණතා මට්ටම 4.8	: කණ්ඩායම් සමග වැඩ කිරීමේ හැකියාව ආදර්ශනය කරයි.

කණ්ඩායම් සමග වැඩ කිරීමේ හැකියාව. . .

අපි එක්වී වැඩ කරමු.

ව්‍යවසායකයාට තම අරමුණු කරා ළඟාවීමේ දී විවිධ පාර්ශවයන්ගේ නොමඳ සහාය ලබාගැනීම අවශ්‍ය වේ. කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමට සිදුවේ. මෙහිදී කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීමේ හැකියාව ඉස්මතු විය යුතු ය.

- අදාළ කටයුතු ආරම්භ කිරීම.
- එකතු වී වැඩ කිරීමේ හැකියාව ඇති කිරීම.
- පෙළඹවීමේ හා ඒත්තු ගැන්වීමේ බලය.
- සංවිධාන කටයුතු
- නියාමනය
- අධීක්ෂණය හා මෙහෙයවීම

සිදුකිරීමෙහිලා පුරෝගාමීවීම තුළින් ව්‍යවසායකත්ව ව්‍යාපාරයේ ඵල නෙළා ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

ව්‍යවසායකයෙක් සාර්ථකත්වය කරා ළඟාවීමේදී තමන් ද කණ්ඩායමක එක් අයකු බව සිතා කටයුතු කිරිම අවශ්‍ය වනු ඇත. තමන්ගේ සිතේ ඇතිවූ අදහසක් ක්‍රියාවට නැංවීමේ ලා අදාළ සම්පත් භාවිතයට ගනිමින් ආරම්භ කිරීමට පුරෝගාමී විය යුතු ය. අදාළ කටයුත්තේ දී විවිධ ආකාරයෙන් මානව සම්පත් දායක කර ගැනීමට සිදු වේ. ඔවුන් අතර විවිධ මතධාරීන් සිටිය හැකි ය. ඒ සැම කෙනකුම එකම අරමුණක් කරා යොමුකරන ආකාරයේ පැවැත්මක් සඳහා පුරෝගාමී වීම අවශ්‍ය වේ.

නියෝග මත ක්‍රියාකිරීම නොව ස්ව කැමැත්තෙන් වැඩට යොමු වීමට තම කණ්ඩායම මෙහෙයවීමට ද අවශ්‍ය දේ තම අභිමතය අනුව සිදු වීම සඳහා කණ්ඩායමේ සැම කෙනෙකුට ම ඒත්තු ගැන්වීමේ හැකියාව ද මෙහිලා වැදගත් වේ.

කණ්ඩායම තුළ මැනවින් සිදුකරන සංවිධාන ව්‍යුහයක් පැවතිය යුතු ය.



නිරන්තරයෙන් ම සිදු කරන මග පෙන්වීම (නියාමනය) වැරදි අවම කිරීමට හේතු වේ. එම නිසා කණ්ඩායමේ ප්‍රධානීන් මාර්ගයෙන් හෝ අන්‍යෝන්‍ය වශයෙන් කෙරෙන මග පෙන්වීමද මෙහිලා වැදගත් කොට සැළකිය යුතු ය. ව්‍යවසායක අරමුණු සාර්ථකත්වයට ලඟාකර ගැනීමට නම් කණ්ඩායම තුළ අධීක්ෂණයක් පැවතිය යුතු ය. එසේ නොවූ විට කණ්ඩායමේ සාමාජිකයන් ඇතැම් විට අරමුණු වලට වෙනස් ආකාරයේ හැසිරීම් රටාවලට යොමු විය හැකි ය. එම නිසා නිරන්තරව සිදු කෙරෙන අධීක්ෂණය හා මෙහෙයවීම තුළින් සමස්ත කණ්ඩායම එක ම අරමුණකට යොමුවීමෙන්...,

- ව්‍යාපාරයේ සාර්ථකත්වය
- පුද්ගලයන්ගේ සාර්ථකත්වයට හේතුවනු ඇත.

පුද්ගලයන් කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම තුළින් ව්‍යාපාරය සාර්ථක වේ. එවිට පුද්ගලයන්ගේ රැකියා ස්ථිර වේ. හොඳ වැටුප් ආදායමක් ලබාගත හැකි ය.

ක්‍රියාකාරකම

සුදුසු ව්‍යාපාර කටයුත්තක් තෝරා ගන්න. එම ව්‍යාපාර කටයුත්තට සම්බන්ධ විය හැකි විවිධ පාර්ශවයන් නම් කරන්න.

උදාහරණ : ඉංජිනේරුවන්, වැඩ පරීක්ෂකවරුන්

එම එක් එක් පාර්ශවයන් අන්තර් සම්බන්ධතාවය පැවැත් විය යුතු ආකාරය සඳහන් කරන්න.